C
377
RAN

# නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් මට්ටමේ විද්‍යා අධ්‍යාපනයේ විකාශනය හා නව ප්‍රවණතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනය.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පද්මිනී රණවීර
(ලි.ප. අංක: M.A./E.D./82/84/09).
ශාස්ත්‍රවේදී ශ්‍රී ලංකා, අධ්‍යාපන ඩිප්ලෝමා -
(සම්මාන) ශ්‍රී ලංකා

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ශාස්ත්‍රපති (අධ්‍යාපන) පශ්චාත් උපාධි පාඨමාලාවේ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධය.

1984.

නිබන්ධන උපදේශක - පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ අංශ ප්‍රධාන , ආර්.පී. ලියනගේ මහතා.

399150

## සංක්ෂේපය.

තුන්වන ලෝකයේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආණ්ඩු සිය ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටුකිරීමෙහි ලා විශාල උනන්දුවක් දක්වයි. ඒ අනුව ආහාර, නිවාස, ඇඳුම්, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි අවශ්‍යතා ලඟාකර දීම සඳහා විවිධ ව්‍යාපෘති දියත්කර ඇති අතර, තම ජාතික ආදායමින් වාර්ෂිකව විශාල කොටසක් ද වැය කරයි.

මෙහි දී ආණ්ඩු මහත් ආයාසයකින් කටයුතු කළ ද, සංවර්ධනය වන රටවල් පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමට සපයන පහසුකම්වලින් වැඩි ඵල ලබන්නේ මධ්‍යම පන්තිකයෝ ය. ශත වර්ෂ හතර හමාරක පමණ යටත් විජිත පාලන ක්‍රමයක් පැවති ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළින් මෙම තත්ත්වය මැනවින් පැහැදිලි වෙයි.

සමාජයේ ඉහළ ස්ථරවලට නැඟීමේ විවිධ මං පෙත් අතර වර්තමානයේ අධ්‍යාපනයට හිමි වී ඇත්තේ විශේෂ ස්ථානයකි. ඒ අතරින් විද්‍යා අධ්‍යාපනයට හිමිව ඇත්තේ බෙහෙවින්ම වැදගත් තැනකි. අධ්‍යාපනය උපයෝගී කරගෙන, සමාජ සචලතාවය ඇති කිරීමේ දී තමා වර්තමානයේ සිටින සමාජ පන්තියේ ඉහළ සමාජ පන්තියකට යාමේ අභිලාෂය මධ්‍යම පන්තිකයන් අතර වැඩි වශයෙන් දක්නට ඇත.

එහෙයින් අධ්‍යාපනය කෙරෙහි විශේෂ උනන්දුවක් මධ්‍යම පන්තිකයන් තුළ ඇත. අධ්‍යාපනයේ ද විද්‍යා අධ්‍යාපනය වඩාත් ඵලදායී ක්ෂේත්‍රය බව ඔවුහු කල්පනා කරති. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනය බොහෝ දුරට මධ්‍යම පන්තියේ වරප්‍රසාදයක් බවට පත්වීමයි.

යටත් විජිත පාලනයෙන් පසු ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල්වල විද්‍යා අධ්‍යා- පනයේ ව්‍යාප්තිය, ප්‍රාදේශීය අතුල්‍යතා සහ නව ප්‍රවණතා පිරික්සීමත්, විද්‍යා –

අධ්‍යාපනයේ ප්‍රගතිය සඳහා යෝග්‍ය යෝජනා ඉදිරිපත් කිරීමත් "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් මට්ටමේ විද්‍යා අධ්‍යාපනයේ විකාශනය හා නව ප්‍රවණතා" පිළිබඳ මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයෙහි මූලික අරමුණ වෙයි.

කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල්හි විද්‍යා විෂය නිර්දේශයන් හා විද්‍යාව ඉගැන්වීමේ ක්‍රමයන් විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කොට විද්‍යා විෂය ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ හා සංස්කෘතික අවශ්‍යතාවයනට ගැලපෙන පරිදි සැලසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් පිළිබඳව පසු පර්යේෂණයන්හිදී අවධානය යොමු විය යුතු යැයි සිතමි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පුස්තකාලය
1986-12-19
පේ රා දෙ ණි ය